............ Proof

(හයවැනි පාර්ලිමේන්තුව — තෙවැනි සභාවාරය)

අංක. 81]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2009 අප්‍රේල් මස 07 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0655/'08

1.

ගරු රවි කරුණානායක මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මේ දක්වා වූ පසුගිය වසර 4ක කාලය තුළ එක් එක් වර්ෂයේදී, වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය විසින් සහ එම අමාත්‍යාංශයට අයත් ඕනෑම සමාගමක් සඳහා කුලියට ගත් එක් එක් වාහනය වෙනුවෙන් ගෙවන ලද මුළු මුදල හා කුලියට ලබා ගත් කාර්යාලයීය ඉඩකඩ සඳහා ගෙවන ලද මුළු මුදල කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාල සීමාව තුළ—

(i) ඉහත කී වාහන සඳහා ඉන්ධන වෙනුවෙන් වැය කළ මුදල කොපමණද හා එම මුදල අමාත්‍යාංශයේ සමස්ත පුනරාවර්තන වියදම් වලින් කුමන ප්‍රතිශතයක්ද;

(ii) ඉහත සඳහන් කාර්යාලයීය ඉඩකඩ සඳහා එක් වර්ග අඩියක් වෙනුවෙන් වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) කල්බදු ක්‍රමය යටතේ එම ගොඩනැගිල්ල ලබා ගෙන ඇත්තේ කොපමණ කාලයක් සඳහාද හා තැන්පතුවක් ලෙස අත්තිකාරම් වශයෙන් ගෙවන ලද මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0897/'08

2.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) නැගෙනහිර පළාත් සභා මැතිවරණ රාජකාරී සඳහා යෙදවූ ඡන්ද මධ්‍යස්ථාන භාර නිලධාරීන්ගේ නාම ලේඛනය, එම නිලධාරීන් සේවය කරන ආයතන සහ තනතුර, අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කයන්ට අදාළව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) උතුරු මැද හා සබරගමුව, පළාත් සභා මැතිවරණ රාජකාරී සඳහා යෙදවූ ඡන්ද මධ්‍යස්ථාන භාර නිලධාරීන්ගේ නාම ලේඛනය එම නිලධාරීන් සේවය කරන ආයතන, තනතුර සහ දිස්ත්‍රික්කය ලෙස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ අනුව නැගෙනහිර, උතුරු මැද සහ සබරගමුව පළාත් සභා මැතිවරණවලදී ඡන්ද මධ්‍යස්ථාන මට්ටමින් සහ ශාලා අංක අනුව ගණන් කිරීමේ ප්‍රධාන නිලධාරී ඇතුළු අනෙකුත් නිලධාරීන්ගේ නාම ලේඛනය, ලිපිනයන් සහ සේවා ස්ථානයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) නැගෙනහිර, උතුරු මැද සහ සබරගමුව පළාත් සභා මැතිවරණ දිනයන්හිදී ක්‍රියාත්මක වූ පරිගණක කාර්යාලයේ නිලධාරීන්ගේ නම, තනතුර සහ ආයතනයන් වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0945/'08

3.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මූලික පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව අනුව දෙනියාය, මොරවක පදිංචිව සිටි ජේ. කේ. ප්‍රේමලතා මහත්මියගේ මරණය ගෙල සිරකිරීමෙන් හා මුහුණ තෙරපීමෙන් වූ ස්වසන අක්‍රියතාවයෙන් සිදුවී ඇති බවට සඳහන් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2004.07.19 වැනි දින ඝාතනයට ලක්වී ඇති ඇයගේ මරණයට අදාළ සැකකරුවන් අත්අඩංගුවට ගෙන පරීක්ෂණයක් පවත්වන ලෙස ඉල්ලා ඇයගේ ස්වාමිපුරුෂයා විසින් අතිගරු ජනාධිපතිතුමාට, ආරක්ෂක ලේකම්ට හා නීතිපතිවරයාට පැමිණිලි කර ඇති බවත්;

(ii) ජනාධිපති ලේකම් කාර්යාලයෙන් 2006.08.11 දිනැතිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පතිවරයාට පරීක්ෂණයක් සඳහා යොමු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් 2007.10.03, 2007.12.12, 2008.02.14, 2008.04.01 හා 2008.06.27 දිනැති ලිපි මගින් පොලිස්පතිවරයාගෙන් වාර්තා ඉල්ලා සිටියද කවර හෝ ප්‍රතිචාරයක් දක්වා නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) පොලිස්පතිවරයා ඇතුළු අදාළ නිලධාරීන් මෙම ඝාතනය සම්බන්ධයෙන් කටයුතු නොකිරීමට හේතුව කවරේද;

(ii) ආරක්ෂක අමාත්‍යාංශයට අදාළ පිළිතුරු ලිපිය යොමු නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0991/'08

4.

ගරු පේමසිරි මානගේ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පුද්ගලයින් ලෙස රජයට ආදායම් බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පුද්ගලයින් මත අයකරන ආදායම් බදු වලින් පසුගිය වර්ෂ දෙක තුළ ඉපයූ මුදල කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) පුද්ගලයින් මත ආදායම් බදු අයකිරීමේදී අනුගමනය කරන වාර්ෂික ආදායම් සීමාවන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1084/'08

5.
ගරු ජිනදාස කිතුලගොඩ මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික රුධිර මධ්‍යස්ථානය ඇතුළු ලේ බැංකු විසින් පාවිච්චි කරන ලද කල් ඉකුත්වූ රුධිර පට්ටිකා පෙරන කට්ටලවල වටිනාකම කොපමණද;

(ii) ගබඩාවල තිබී සොයාගන්නා ලද කල් ඉකුත්වූ රුධිර පට්ටිකා පෙරන කට්ටලවල වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) නීති විරෝධී මෙන්ම සෞඛ්‍ය ආචාර ධර්මවලට පටහැනි අයුරින් අපරීක්ෂාකාරීව හෝ වංචා සහගතව කටයුතු කර ඇති අදාළ අමාත්‍යාංශයේ නිලධාරීන් සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) මෙම ක්‍රියාවලියට අදාළව ජාතික රෝහලේ මධ්‍යම ලේ බැංකුවේ තොග ලේඛන වෙනස් කර ව්‍යාජ තොග ලේඛන සකස් කරන ලද නිලධාරීන් සම්බන්ධයෙන් මේ වනවිට පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iii) ඊට සම්බන්ධ නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1111/'08

6.
ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුරට පත්කරනු ලැබ ඇත්තේ කවුරුන්ද;

(ii) ඔහුගේ සම්පූර්ණ නම හා පෞද්ගලික ලිපිනය කවරේද;

(iii) ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් කවරේද;

(iv) ඔහු එම තනතුරට බඳවාගෙන ඇත්තේ කවර පදනමකින්ද;

(v) ඔහුගේ මූලික වැටුප, සියලු දීමනා සහිතව ලබන වැටුප, ලබන වෙනත් වරප්‍රසාද හා දීමනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0693/'08

7.
ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රටේ සමස්ත ශ්‍රම බලකාය;

(ii) පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ ශ්‍රම බලකාය වෙන් වෙන් වශයෙන්;

(iii) සන්නද්ධ හමුදාවල, පොලිසියේ, සහායක හමුදා සේවාවන් සහ අනෙකුත් ආදී වශයෙන් රාජ්‍ය අංශ ශ්‍රම හමුදා සහභාගීත්වය වෙන් වෙන් වශයෙන්;

(iv) ඉහත කී ප්‍රශ්ණ අංක (i) සහ (ii) පරිදි රටට දැරීමට සිදුවන පිරිවැය (සමස්ත වැටුප්);

යනාදී විස්තර ඉකුත් වසර 10 සඳහා වාර්ෂික පදනමින් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) සහ (අ) (ii) පරිදි සමස්ත විශ්‍රාම වැටුප් පිරිවැය සහ ඉදිරි 15 වසර සඳහා දැරීමට සිදුවන සමස්ත විශ්‍රාම වැටුප් ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත (අ) (iii) පරිදි අනියම් හෝ ස්ථිර සේවකයින් නොවන සේවකයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?

1102/'08

8.

ගරු ජිනදාස කිතුලගොඩ මහතා,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රට තුළ ඇති මුළු වගුරු බිම් සංඛ්‍යාව අවසන් වරට හඳුනාගෙන තිබුණේ කවර වර්ෂයකදීද;

(ii) ඒ වනවිට දිවයිනේ තිබූ වගුරුබිම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) අනවසරයෙන් වගුරුබිම් ගොඩකිරීම පිළිබඳ තොරතුරු දැනගැනීමට ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව අනුගමනය කරන ක්‍රමවේදය කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) වගුරුබිම් හඳුනාගෙන ඒවා ගැසට් කිරීමේ වැඩපිළිවෙළක් තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1112/'08

9.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ ප්‍රවාහන ගිණුම් නිලධාරී තනතුරට පත්කරනු ලැබ ඇත්තේ කවුරුන්ද;

(ii) ඔහුගේ සම්පූර්ණ නම හා පෞද්ගලික ලිපිනය කවරේද;

(iii) ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් කවරේද;

(iv) ඔහු එම තනතුරට බඳවාගෙන ඇත්තේ කවර පදනමකින්ද;

(v) ඔහුගේ මූලික වැටුප, සියලු දීමනා සහිතව ලබන වැටුප, ලබන වෙනත් වරප්‍රසාද හා දීමනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1142/'08

10.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය 2002.12.31 වැනි දින ඈවර කරන ලද බවට 2004.02.31 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රසිද්ධියට පත්කර ඇති බවත්;

(ii) සේවකයිනට ලබා දුන් වරප්‍රසාද අනුව වන්දි ලබාගෙන සේවයෙන් ඉවත්වීමටත්, රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය වීමටත් අවස්ථාව ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වන්දි ලබාගෙන සේවයෙන් ඉවත් නොවූ විවිධ තනතුරු කාණ්ඩවලට අයත් සේවකයින් කොපමණ සංඛ්‍යාවක් දැනට සේවයේ යෙදී සිටින්නේද;

(ii) ඒ ඒ තනතුරු කාණ්ඩවලට අදාළව සුදුසු රාජකාරි වගකීම් පවරා දී තිබේද;

(iii) එම තනතුරු කාණ්ඩ අතුරින්, සහකාර අධ්‍යක්ෂ/කෘෂිකර්ම පර්යේෂණ සහ ඵලදාවර්ධන නිලධාරි තනතුර දරන විධායක නිලධාරීන් සඳහා ඔවුන් ලබා ඇති සේවා කුසලතා මත රාජකාරීන් පවරා තිබේද;

(iv) ඵලදායී සේවාවක් එම නිලධාරීන්ගෙන් රජයට ලබා ගන්නේ නම් ඒ කවරේද;

(v) ඉහත (ආ) (iii) නිලධාරීන් අදාළ අමාත්‍යාංශයට අනුයුක්තකර දැනට කොපමණ කාලයක් ගතවී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1146/'08

11.
ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2008 වර්ෂයේදී කොළඹ මහ රෝහලට ප්‍රතිකාර සඳහා පැමිණ, ශල්‍යකර්ම සිදුකළ යුතු බවට හඳුනා ගන්නා ලද හෘද රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ශල්‍යකර්ම සඳහා ලියාපදිංචි වූ හෘද රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ශල්‍යකර්ම සිදුකළ හෘද රෝගීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශල්‍යකර්මයට භාජනය කළ යුතු එහෙත් රෝහල් පහසුකම් ප්‍රමාණවත් නොවීම මත 2008 වර්ෂයේ ශල්‍යකර්ම සිදු කිරීමට නොහැකි වූ හෘද රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2005, 2006, 2007 වර්ෂවල එසේ ශල්‍යකර්මවලට යොමු කිරීමට නොහැකි වූ හෘද රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0704/'08

12.
ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ජාතික ඉතිරි කිරීමේ බැංකුව (NSB) ඉන්දියාවේ ICICI බැංකුවෙන් ඇ.ඩො. මිලියන 50 ක් ණයට ගෙන එම මුදල රජයට ණයට දී ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම මුදල ණයට ගැනීමේදී හා නැවත ණයට දීමේදී එකඟ වන ලද කොන්දේසි පිළිබඳ සම්පූර්ණ විස්තර කවරේද;

(ii) ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයට පෙර මේ හා සමාන ගනුදෙනු සිදුකර තිබේද;

(iii) එසේ නම්, එම ගනුදෙනු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය —

(i) විසින් මෙවැනි ගනුදෙනු සිදුකරනු ලැබීම සඳහා එහි පාලක ව්‍යවස්ථාව මගින් එම අධ්‍යක්ෂ මණ්ඩලයට බලය පවරා තිබේද;

(ii) මෙවැනි විදේශ මුදල් ගනුදෙනුවල යෙදීමේ උපාය මාර්ගයෙහි විචක්ෂණශීලී බව සහ ඇතිවිය හැකි අවදානම සලකා බලා තිබේද;

(iii) රජය හෝ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය හෝ භාණ්ඩාගාර ලේකම් විසින් ඉහත ක්‍රියාමාර්ගය ගැනීමට මෙහෙයවනු ලැබුවේද සහ එවැනි මෙහෙයවීමක් කිරීමට මුල් වූ කරුණු කවරේද;

(iv) මහ බැංකුවෙන් විශේෂ අවසරය ලබාගෙන තිබේද;

(v) සහ ඉහත බලධාරීන් දණ්ඩ නීති සංග්‍රහයට අනුව දඬුවම් ලැබිය හැකි, බලය අනිසි ලෙස භාවිත කිරීමේ ක්‍රියාවක යෙදී තිබේද;

(vi) සිය වගකීම් සහ වගකිව යුතු බව පිළිබඳ අවබෝධයෙන් යුතුව පරිපූර්ණ අවදානම් සමාලෝචනයක් සිදුකර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1113/'08

13.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) කොළඹ 10, මාලිගාවත්ත, රජ පොකුණ මාවතේ පදිංචි ඩබ්ලිව්. එල්. පී. සිරියාවතී මහත්මිය විසින් මාලිගාවත්ත නව නගරයේ පිහිටි රජපොකුණ නමැති නාන ළිඳ වර්ෂ 32ක පමණ කාලයක් තිස්සේ නඩත්තු කරමින් පාලනය කරන බව එතුමිය දන්නෙහිද?

(ආ) වාර්ෂිකව බදු ගෙවමින් මෙතෙක් පාලනය කළ මෙම නාන ළිඳ, වෙනත් පිරිසකට ලබාදීමට උත්සාහ ගන්නේ කවර හේතුවක් නිසාද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම නාන ළිඳ අසල බුදු මැදුරක් ඉදිකිරීම සඳහා කටයුතු කරද්දී එය කඩා බිඳ දමා රු. ලක්ෂ 05ක පමණ අලාභයක් මැයට සිදුකර ඇති බවත්;

(ii) මෙම ස්ථානයේ වෙනත් ආගමික වතාවත් සපුරා ගැනීමට උත්සාහ කරන බවත්;

එතුමිය පිළිගන්නෙහිද?

(ඈ) දරුවන් 9 දෙනෙකුගේ මවක් වන සිරියාවතී මහත්මියට තවදුරටත් මෙම නාන ළිඳ පාලනය කිරීමට එතුමිය අවශ්‍ය කටයුතු සලසා දෙන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1147/'08

14.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2008 වර්ෂයේදී කොළඹ-දකුණ කළුබෝවිල ශික්ෂණ රෝහලට ප්‍රතිකාර සඳහා පැමිණ, ශල්‍යකර්ම සිදුකළ යුතු බවට හඳුනා ගන්නා ලද හෘද රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ශල්‍යකර්ම සඳහා ලියාපදිංචි වූ හෘද රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ශල්‍යකර්ම සිදුකළ හෘද රෝගීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශල්‍යකර්මයට භාජනය කළ යුතු එහෙත් රෝහල් පහසුකම් ප්‍රමාණවත් නොවීම මත 2008 වර්ෂයේ ශල්‍යකර්ම සිදු කිරීමට නොහැකි වූ හෘද රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2005, 2006, 2007 වර්ෂවල මෙසේ ශල්‍යකර්මවලට යොමු කිරීමට නොහැකි වූ හෘද රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1161/'08

15.
ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය ඇවර කිරීමේදී වන්දි ලබාගෙන සේවයෙන් ඉවත් නොවූ තනතුරු කාණ්ඩවල සහකාර අධ්‍යක්ෂ/කෘෂිකර්ම පර්යේෂණ හා එළදාවර්ධන නිලධාරීන් සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශයේ ලේකම් සහ කෘෂිකර්ම සංවර්ධන අධිකාරියේ ඇවරකරුටද පිටපත් සහිතව අය වැය අධ්‍යක්ෂ ජනරාල් අමතා අංක DMS/A සහ L 05 හා 2003.07.03 දිනැති ලිපියෙන් උපදෙස් ලබා දී ඇති (1), (11) යෝජනා එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම යෝජනා ක්‍රියාත්මක කිරීමට දැනට ගෙන ඇති පියවර සහ ඉදිරිපත් කර ඇති සැලසුම්, යෝජනා කවරේද;

(ii) ඒවා ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී ඇත්නම් එයට හේතු කවරේද;

(iii) ඉහත නිලධාරීන්ට කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක අවධියේ ලබා දී තිබූ වේතන, දීමනා හා අනෙකුත් පහසුකම් සපයාදී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම නිලධාරීන් ඉහත (අ) හි දැක්වෙන යෝජනාවන්ට අනුව රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල පුරප්පාඩු හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, එම තනතුරු කාණ්ඩ සහ පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) ඉහත සහකාර අධ්‍යක්ෂ/කෘෂිකර්ම පර්යේෂණ හා එළදාවර්ධන නිලධාරීන් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කර එම තනතුරු ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේදී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.
අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන),— කාලය අනුව තීරණය කරනු ලබන ආකාරයකට ගෙවීම් පැහැර හැර ඇති බදු අයකර ගැනීම පිණිස ක්‍රමවත් සහ කඩිනම් ක්‍රියාවලියක් සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; යම් අවස්ථාවන්හි දී පැහැර හැර ඇති බදු කපා හැරීම සඳහා ද; ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

2.
අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන),— 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

3.
නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා භූ දර්ශන නිර්මාණ ශිල්පී ආයතනය,— ශ්‍රී ලංකා භූ දර්ශන නිර්මාණ ශිල්පී ආයතනය පිහිටුවීම සහ එයට සම්බන්ධ වූ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

4.
පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතුය.

5.
පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2008.06.05 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 4.30 දක්වා විය යුතු ය. අ. භා. 4.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතුය.

6.
පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— ස්ථාවර නියෝග 7(1) හි විධිවිධානවල සහ 2008.06.05 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, 2009 අප්‍රේල් මස 20 වැනි සඳුදා පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතුය.

7.
පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3),— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2009 අප්‍රේල් මස 20 වැනි සඳුදා පූ.භා. 9.30 වන තෙක් කල් තැබිය යුතුය.

8.
ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— වරප්‍රසාද (අංක 1),— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2008 නොවැම්බර් මස 11 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුය.

9.
ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— වරප්‍රසාද (අංක 2),— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2008 ඔක්තෝබර් මස 22 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුය.

10.
ගරු විජයදාස රාජපක්ෂ මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය,—

"එස්. බී. නාවින්න පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2009 අප්‍රේල් මස 02 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*2.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ යෝජනාව,— මෙයට පෙර යෝජනාව මගින් අවසර දෙන ලද මුදලට වැඩිමනත් වශයෙන් රුපියල් කෝටි පහළොස් දහසකට (රු. 15,000,00,00,000) නොවැඩි මුදලක් ශ්‍රී ලංකාවේ දී ශ්‍රී ලංකා ආණ්ඩුවේ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමෙන් ණයට ගැනීමටත්, එම කාර්ය සඳහා (417 වැනි අධිකාරය වන) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ 2(1) වැනි වගන්තිය යටතේ අවශ්‍ය සියලුම අවසර මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට දීමටත් මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*3.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 12 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 12 දරන නියමය

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 225,00,00,000<br>රු. 373,60,00,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 225,00,00,000<br>රු. 250,00,00,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 400,00,00,000<br>රු. 600,00,00,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 10,00,00,000<br>රු. 25,00,00,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2008.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය,

2009.02.13 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*4.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනාව,— 2009.03.20 වැනි දින ඉදිරිපත් කරන ලද (235 වැනි අධිකාරය) රේගු ආඥා පනතේ 10 වැනි වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් වූ යෝජනාව අනුමත කළ යුතුය.

(2009 පෙබරවාරි 03 දිනැති අංක 1587/9 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

*5.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2009 ජනවාරි 20 දිනැති අංක 1585/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.03.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*6.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2009 පෙබරවාරි 03 දිනැති අංක 1587/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.03.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*7.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2009 පෙබරවාරි 26 දිනැති අංක 1590/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.03.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*8.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත —දෙවැනි වර කියවීම.

*9.

වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*12.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*13.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජූනි 17) [1]

*14.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*16.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*17.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*18.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*19.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.)[1]

*20.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/- |
| | රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*21.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචානාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*22.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007. 08. 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*23.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*25.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 දිනැති අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*26.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

27.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

28.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

29.

ශ්‍රී පාද කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

30.

බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම.

31.

විශේෂ අවශ්‍යතා සහිත වූ ළමයින් සඳහා වූ කෝසල දුල්ලෑව පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---